**මහනුවර මහා නගර සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 24 දින ආයෝජනය කර තිබූ ස්ථාවර තැන්පතුවක් සඳහා දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.2,991,781 ක පොළිය රු.3,164,383 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.172,602 ක් වැඩියෙන් දක්වා තිබුණි.**

**(ආ) ස්ථාවර තැන්පතු 15 ක සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු එකතු පොලී රු.4,181,247 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.**

**(ඇ) කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබී තිබූ රු.737,500 ක මුදලක් හා සමාලෝචිත වර්ෂයේ කොම්පෝස්ට් බඳුන් අලෙවියෙන්ලැබී තිබූ රු.619,015 ක ආදායමක් විවිධ තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබුණි.**

**(ඈ) 1995 වර්ෂය දක්වා නගර සභාව සතුව තිබූ විදුලි පද්ධතිය ලංකා විදුලි බල මණ්ඩලයට පවරා දීමේ දී, පවරා ගත් වගකීම්වල වටිනාකම රු.50,443,104 ක් මූල්‍ය ප්‍රකාශනවල කලින් ලැබීම් යටතේ දක්වා තිබුණි.**

**(ඉ) සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ගිවිසුම්ගත නොවූ රු.3,890,446 ක් වටිනා කර්මාන්ත 5 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.**

(ඊ) සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු රු.**3,616,118** ක් වටිනා යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ හා ලී බඩු අයිතම **14** ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ වෙන්දේසි කළ හා විනාශ කළ වත්කම්වල පිරිවැය වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකර රු.**7,000,120** ක් වූ තක්සේරු වටිනාකම පොත්වලින් ඉවත් කර තිබුණි.

(ඌ) ජල ගාස්තු ආදායම් මෘදුකාංග පද්ධතිය අනුව, සමාලෝචිත වර්ෂයේ ජල ගාස්තු බිල් කිරීම රු.**527,224,314** ක් රු.**521,481,547** ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, ආදායම් රු.**5,742,767** ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(එ) ජල ගාස්තු ආදායම් මෘදුකාංග පද්ධතිය අනුව, සමාලෝචිත වර්ෂයේ ජල ගාස්තු ලැබීම් රු.**525,142,412** ක් රු.**525,161,441** ක් ලෙස ගිණුම්වල දැක්වීම හේතුවෙන්, රු.**19,029** ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) මැණික්කුඹුර තොග සහ සිල්ලර වෙළඳ සංකීර්ණ කඩ කුලී ලේඛනයට අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට හිඟ කඩ කුලී වටිනාකම රු.**4,433,568** ක් වුවත්, රු.**4,331,140** ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, රු.**102,428** ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඔ) බෝගම්බර වෙළඳ සංකීර්ණයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට හිඟ හිට තිබූ රු.**3,259,001** ක කඩ කුලී සහ දඩ ගාස්තු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) ත්‍රී රෝද රථ ගාස්තු ලේඛන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට පැවති රු.**17,860,626** ක හිඟ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය අවසානයට ඩිජිටල් ප්‍රදර්ශන දැන්වීම් තිර සඳහා මාස **4** කට අදාළව ලැබිය යුතුව තිබූ රු.**406,000** ක මුදල ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2** නොසැසඳු පාලන ගිණුම්.

---------------------------

ගිණුම් විෂයයන් **8** කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව, ශේෂයන්ගේ එකතුව රු.**476,300,843**ක් වූ අතර, ලේඛන/ උපලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.**482,674,884** ක් වූයෙන්, රු.**6,374,041**ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3** ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.

-----------------------------------

(අ) ලැබියයුතු ගිණුම්.

--------------------

**2016** දෙසැම්බර් **31** දිනට ලැබියයුතු ගිණුම් ශේෂ **11** ක එකතු වටිනාකම රු.**501,474,277** ක් වූ අතර, එයින් අවුරුදු **1** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.**406,491,963**

ක් වී තිබුණි. මින් 2017 ජූලි 31 දිනට තවදුරටත් ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 11 ක වටිනාකම රු.404,815,451 ක් විය.

(ආ) ගෙවියයුතු ගිණුම්.

2016 දෙසැම්බර් 31 දිනට රු.573,732,974 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතු වටිනාකමින් රු.430,938,795 ක් වියදම් ණයහිමියෝ වූ අතර, ඉන් අවුරුදු 1 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.67,093,507ක් විය. 2017 ජූලි 31 දිනට රු.399,715,074 ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

ගිණුම් විෂයයන් 14 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.1,161,810,807 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත (252) වන අධිකාරය | |
| | 227 ඡේදයට සමගාමීව 2002 අගෝස්තු 09 දිනැති අංක 1249 දරන ගැසට් පත්‍රයේ පළ කළ මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවේ 111 වන කොටසේ 4(ඇ) ඡේදය | අක්කර 2.5 ක භූමි ප්‍රමාණයකින් සමන්විත මහනුවර මහා නගර සභාවට අයත් ගැටඹේ ක්‍රීඩාංගණය 2016 අගෝස්තු 08 සිට 26 දක්වා කාල පරිච්ඡේදය තුළ සැණකෙළි පැවැත්වීම සඳහා ටෙන්ඩර් පරිපාටියෙන් තොරව රු.3,000,000 කට බදු දී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය - 2013 | |
| | V වන පරිච්ඡේදයේ 2.5.4 වගන්තිය | මහනුවර මහා නගර සභාවේ පළමු පෙළ ගිණිහට නිලධාරීවරයෙකු |

ඔහුගේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයෙන් නිදහස් කර තිබූ නමුත්, මොහු සේවයෙන් මුදා හැර සිටි **2015** මැයි **20** සිට **2016** මාර්තු **17** දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව රු.**422,214** ක වැටුප් හා දීමනා ගෙවා ඔහුගේ සේවා කාලය ද ලබා දී තිබුණි.

**2.** මූල්‍ය සමාලෝචනය.
----------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල.
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, **2016** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.**518,109,683** ක් වු අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.**385,165,618** ක්වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.**132,944,065** ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2** ආදායම් පරිපාලනය.
-----------------------

**2.2.1** ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.
---------------------------------------

ජල ගාස්තු, ත්‍රී වීල් ගාස්තු හා උසාවි දඩ ආදායම්වලට අදාළ ඉදිරිපත් කළ යුතු තොරතුරු,ලේඛන සමඟ නොසැසඳීම් හේතුවෙන්, එම ආදායම්වල එකතුව වූ රු.**153,719,587** ක් හැර වරිපනම්, බදු කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.**457,543,502** ක ශේෂයක් හිඟ හිටව පැවතුණි.

**2.2.2** වරිපනම්.
----------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.**101,922,032** ක හිඟයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.**283,601,784** ක් විය. වර්ෂයේ අය කිරීම් හිඟයෙන් සියයට **47** ක් හා බිල් කිරීම්වලින් සියයට **83** ක් වී තිබුණි. **2016** දෙසැම්බර් **31** දිනට රු.**100,380,560** ක ශේෂයක් අය විය යුතුව තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ වරිපනම් අය කිරිම සම්බන්ධව නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම හේතුවෙන්, හිඟයෙන් අය කිරීම් ඉතා

දුර්වල මට්ටමක පැවතිණි. මහා නගර සභා ආඥා පනතේ **242** වගන්තියේ විධිවිධාන අනුගමනය කර හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3** බදු කුලී.
----------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.**105,943,556** ක හිඟයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.**67,870,036** ක් විය. වර්ෂයේ අය කිරීම් හිඟයෙන් සියයට **21** ක් හා බිල් කිරීම්වලින් සියයට **77** ක් වී තිබුණි. **2016** දෙසැම්බර් **31** දිනට රු.**98,906,302** ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව තිබූ අතර, හිඟ බදු කුලී අය කිරීමේ දුර්වලතාවයක් පැවතුණි. මෙම ශේෂයෙන් **2017** ජුනි **30** දිනට රු.**80,681,995** ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

**2.2.4** වෙනත් ආදායම්.
------------------

(අ) ජල ගාස්තු.
-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට රු.**100,906,508** ක හිඟ ශේෂයක් පැවති අතර, මෙම හිඟ ශේෂයේ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරුණි.

(ආ) විනෝද බදු
-------------

මහනුවර ඇසළ පෙරහැරට සමගාමීව මහනුවර මහා නගර සභාවට අයත් ගැටඹේ ක්‍රීඩාංගණයේ හා කටුගස්තොට රාහුල විද්‍යාලයට අයත් ක්‍රීඩාංගණයේ **2016** අගෝස්තු **08** දින සිට **2016** අගෝස්තු **20** දක්වා පැවති ඇසළ මේලා සැණකෙළි ප්‍රදර්ශනවල ප්‍රවේශ පත්‍ර මුද්‍රා තැබීමට ඉදිරිපත් කිරීම, මුද්‍රා තැබීම, මුද්‍රණ ආයතනයේ තොරතුරු ලබා ගැනීම, ලේඛන නඩත්තු කිරීම, ලිපිගොනු පවත්වා ගැනීම හා **1984** අංක **37** දරන විනෝද බදු (සංශෝධන) පනත අනුව විනෝද බදු අය කිරීම යනාදිය අවිධිමත්ව සිදු කර තිබුණි.

(ඇ) ඉඩම් බදු.
-----------

ඉඩම් බදු අය කිරීම් ලේඛනය අනුව, සභාව විසින් ඉඩම් **1078** ක් බදු දී ඇතත්, බිල් කිරීම් ලෙස හඳුනා ගෙන ඇත්තේ ඉන් **51** ක් පමණි. බදු දී ඇති සියලු ඉඩම් සම්බන්ධයෙන් අඛණ්ඩව බිල් කිරීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබූ අතර, ඉඩම් බදු ලේඛනය අනුව, බදු දී ඇති ඉඩම්

**ප්‍රමාණය 981 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.34,952,454 ක හිඟ ඉඩම් බදු ශේෂයක් පැවතුණි.**

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**---------------------------**

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.3,385,567 ක් හා මුද්දර ගාස්තු රු.33,745,673 ක් අයවිය යුතුව තිබුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**---------------------------**

**3.1 කාර්යයසාධනය**

**------------------**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

**(අ) සමාලෝචිත වර්ෂයේ සැලසුම් කර තිබූ රු.70,483,540 ක් වටිනා ප්‍රාග්ධන ව්‍යාපෘති 57 ක් වර්ෂය තුළ ආරම්භ කිරිමට නොහැකි වී තිබූ අතර, රු.143,000,000 ක් වටිනා ව්‍යාපෘති 8 ක් අවිච්ඡේද කර තිබුණි.**

**(ආ) 1987 සැප්තැම්බර් 30 දිනැති අංක 8 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව පිහිටුවා ඇති නාගරික සංවර්ධන බැංකු ගිණුමේ පැවති රු.12,316,870 ක මුදල් කිසිදු සංවර්ධන ව්‍යාපෘතියකට යොදා ගෙන නොතිබුණි.**

**(ඇ) ලෝක උරුම සංවර්ධන අරමුදලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,879,949 ක ශේෂයක් පැවති අතර, මෙම අරමුදල උපයෝගී කර ලෝක උරුම සංරක්ෂණයන් වෙනුවෙන් කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.**

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**----------------------------------**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

**(අ) චීන විදේශ සංචාරය**

**----------------------**

චීනයේ කසළ කළමනාකරණය ඇතුළුව විෂයයන් 6 ක් පිළිබඳව චීනයේ නගර සභාවක පැවති අධ්‍යයන වැඩසටහනකට 2016 ජුනි 24 දින සිට 28 දින දක්වා මහා නගර සභාවේ නගරාධිපති සමග නාගරික මන්ත්‍රීවරු 18 දෙනෙකු සහ නාගරික කොමසාරිස් සමග නිලධාරීන් 10 දෙනෙකු සහභාගී වී එකතුව රු.10,904,726 ක මුදලක් මහා නගර සභා අරමුදලින් දරා තිබුණි. මේ සම්බන්ධ පහත නිරීක්ෂණයන් කෙරේ.

**(i)** වැඩසටහනේ සඳහන් අරමුණු ඉටු කර ගැනීමට හැකි වන ආකාරයෙන් එකී කරුණුවලට අදාළ වන වෘත්තීන්වල නිරත වන නිලධාරීන් සහභාගි කරවිය යුතු වුවත්, ඊට පරිබාහිර ක්ෂේත්‍රවල නියැලෙන නිලධාරීන් පදනමකින් තොරව තෝරා ගෙන තිබුණි.

**(ii)** නාගරික මන්ත්‍රීවරුන්ගේ ධූර කාලය 2016 ජුනි 30 දින අවසන් වීමට ආසන්නව තිබිය දී විදේශ වැඩමුළුවලට සහභාගී කරවීම නිසා, ඒ මඟින් ලබා ගන්නා දැනුම බල ප්‍රදේශයේ උන්නතියට යොදවා ගැනීමට නොහැකි වීමෙන් ඔවුන් වෙනුවෙන් වැය කර ඇති රු.6,819,027 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) වාහන පාලනය.
----------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** ධාවන සටහන්වල ගමන් විස්තර හෝ ගමන් කළ නිලධාරීන් පිළිබඳ විස්තර නොදක්වා කි.මී. 34,392 ක් ධාවනය කර ඒ වෙනුවෙන් ඉන්ධන සඳහා රු.593,586 ක් වැය කර තිබුණි. එසේම, නියැදියක් ලෙස ලබා ගත් වාහන 6 ක දෛනික ධාවන සටහන්වල දින 137 ක පිට වූ වේලාව හා පැමිණි වේලාවන් දක්වා නොතිබුණි.

**(ii)** 2015 වර්ෂය තුළ හා 2016 ජනවාරි 01 සිට ජුලි 08 දක්වා පරීක්ෂණයට භාජනය වූ කාලය තුළ නාගරික මන්ත්‍රීවරුන් 15 දෙනෙකු තම පෞද්ගලික ගමන් සඳහා කි.මී.11,710 ක් ධාවනය කර රු.175,959 ක් ඉන්ධන වෙනුවෙන් වැය කර තිබුණි.

**(iii)** 2014, 2015 හා 2016 වර්ෂ තුළ වාහන විෂයය භාර නිලධාරීවරයා විසින් වාහනය පාවිච්චි කරන නිලධාරියාගේ අත්සන යොදා කි.මී.52140 ක් ධාවනය කර රු.822,680 ක් ඉන්ධන සඳහා වැය කර තිබුණි.

**(iv)** කුලී පදනම මත ලබා ගෙන තිබූ වෑන් රථ 3 ක් සභා සම්මුතීන්ට හා ගිවිසුම්වල සඳහන් නියමයන්ගෙන් බැහැරව ධාවනය කිරීම වෙනුවෙන් 2015 හා 2016 වර්ෂයන් හී රු.264,824 ක් ගෙවා තිබුණි.

(v) වාහනයක 2015 දෙසැම්බර් 01 දින සිදු වූ කාර්මික දෝෂය හේතුවෙන්, නාගරික කාර්මික වැඩ පළ වෙතින් අවස්ථා කිහිපයක දී එකතුව රු.611,200 ක් වැය කර අලුත්වැඩියාවන් සිදු කර ගෙන ඇතත්, 2016 සැප්තැම්බර් 30 දින වන විටත් ධාවනය කළ හැකි තත්ත්වයට පත් කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) සේවක ණය.
---------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2004 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය තුළ මිය ගිය හා විශ්‍රාම ගිය, සේවය අත හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 98 දෙනෙකුගෙන් රු.6,212,219 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නෙතිබුණි.

(ii) සුනාමි ව්‍යසනයෙන් අතුරුදන් වූ නිලධාරිනියකගෙන් අය විය යුතුව තිබූ රු.67,296 ක ණය ශේෂය වර්ෂ 12 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(iii) 1995 වර්ෂයේ ලංකා විදුලි බල මණ්ඩලයට අනුයුක්ත වූ නිලධාරීන් 34 කගෙන් අය විය යුතුව තිබූ රු.77,271 ක ණය ශේෂයක් හා එසේ අනුයුක්ත කර තිබූ නිලධාරීන් 30 කගෙන් වැඩි පුර අය කරන ලද රු.122,513ක ශේෂයක් වර්ෂ 21 ක කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(iv) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 180 දෙනෙකුගෙන් 1998 සිට 2016 දක්වාකාලය තුළ අය විය යුතු රු.12,766,367 ක ණය ශේෂයක් සහ නිලධාරීන් 26 දෙනෙකුගෙන් වැඩි පුර අය කර තිබූ රු.106,697 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. 2017 ජුලි 25 දින වන විට රු.10,587,659 ක ණය ශේෂයක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

(ඇ) බැංකු ගිණුම්.
--------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බැංකු ගිණුම් 2 ට අදාළව 2013 වර්ෂයේ සිට 2016 ඔක්තෝබර් 31 දක්වා කාලය තුළ තැන්පත් කළ නමුත්, උපලබ්ධි නොවූ රු.80,999 ක් වටිනා චෙක්පත් 19 ක්, සහ මුදල් පොත අනුව බැංකු තැන්පතු ලෙස හඳුනා ගෙන තිබූ අයිතම 9 කට අදාළ රු.95,284 ක් සහිතව එකතුව රු.176,283 ක් වූ බැංකු තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ii)** බැංකු ගිණුම් 2 ට අදාළව බැංකුවේ සෘජු බැර කිරීම් එකතුව රු.2,310,366 ක් වටිනා අයිතම 115 ක් හා සෘජු හර කිරීම් එකතුව රු.156,419 ක් වටිනා අයිතම 11 ක් 2017 ජුලි 31 වන විටත් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ)** පොදු තැන්පත්.

----------------

2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයේ දී විවිධ කාර්යයන් වෙනුවෙන් අවස්ථා 469 කදි ලැබී තිබූ රු.1,013,225 ක මුදලක් හා ආදායමක් ලෙස නිශ්චිතව හඳුනා ගැනීමට හැකි හා අදාළ කාර්යය සඳහා යෙදවිය හැකි අවස්ථා 28 කදී ලැබී තිබූ රු.13,096,634 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා.

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** පොදු කටයුතු සඳහා වෙන් කළ ඉඩම්.

----------------------------------------

බෝවල, ගොරකගහමුලතැන්න නමැති ඉඩමේ අංක 279 දරන පිඹුරේ පොදු කටයුතු සඳහා වෙන් කළ කැබලි අංක 02, 03 ඒ, 11 සී හා 13 බී දරන පර්චස් 34.90 කින් සමන්විත ඉඩම් කොටස් පොදු කටයුතු සඳහා මහා නගර සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** රජයේ නිවාස.

----------------

වර්ෂ 10 කට අධික කාලයක සිට සභාවේ සේවය කර, විශ්‍රාම ගිය, ස්ථාන මාරු වී ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 8 දෙනෙකු මහා නගර සභාවට අයත් නිවාසවලින් ඉවත් වී නොතිබූ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට එම නිවාසවලින් රු.683,109 ක මුදලක් අය කර ගත යුතුව තිබුණි.

**(ඇ)** වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ.

-----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

**(i)** 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා ලිපිද්‍රව්‍ය ගබඩාවල සමීක්ෂණ වාර්තා අනුව ඉන්වෙන්ට්‍රි අයිතම 14 ක අතිරික්තයක් හා අයිතම 86 ක ඌනතාවයක් ද, ලිපිද්‍රව්‍ය තොග අයිතම 87 ක අතිරික්තයක් හා අයිතම 114 ක ඌනතාවයක් ද පැවතුණි.

(ii) ඉන්ධන ගබඩාවේ **2016** දෙසැම්බර් **31** දිනට රු.**1,571,232** ක වටිනා තොග අයිතම **67** ක ඌනතාවයක් හා රු.**1,234,042** ක් වටිනා තොග අයිතම **25** ක අතිරික්තයක් දක්නට ලැබුණි. වටිනාකම දක්වා නොතිබූ තොග අයිතම **11** ක අතිරික්තයක් පැවතුණි.

**3.4** මතබේදයට තුඩුදුන් ගනුදෙනු.
------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විධිමත් ටෙන්ඩර් පරිපාටියක් අනුගමනය කිරීමකින් තොරව මහා නගර සභා පරිශ්‍රය තුළ වර්ග අඩි **50** ක පමණ කොටසක ආපනශාලාවක් පවත්වා ගෙන යාමට බාහිර පාර්ශවයකට ඉඩකඩ ලබා දී ඉන් මාසිකව ලබා ගන්නා රු.**7,000** ක කුළිය මහා නගර සභා නිලධාරීන්ගේ ක්‍රීඩා සමාජයකට බැර කර තිබුණි.

(ආ) මහා නගර සභා පරිශ්‍රයට ඇතුළු වන ස්ථානයේ පිහිටි මුර කුටියට යාබඳව ගොඩනැගිල්ලේ වර්ග අඩි **25** කට ආසන්න කොටසක පවත්වා ගෙන යනු ලබන කිරිහල සම්බන්ධව කිසිදු නීත්‍යානුකූල ලිපි ලේඛන සභාව සතුව නොතිබූ අතර, ඉන් කුලී අය කිරීමක් ද කර නොතිබුණි.

**3.5** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.
--------------------------------------

**2016** අගෝස්තු **23** දින වන විට රු.**292,194** ක් වටිනා කාකි ඩ්‍රිල් රෙදි **(60" පළල)** මීටර් **811.65** ක් හා රු.**397,660** ක් වටිනා ටී ෂර්ට් **1484** ක් නිකුත් කිරීමකින් තොරව ගබඩා කර තිබුණි.

**3.6** කොන්ත්‍රාත් පරිපාලනය.
----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නගර සභා අරමුදල් යටතේ නුවරවෙල ක්‍රීඩා පිටිය අසල තුන් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.**11,620,388** ක් **2016** මාර්තු **16** දින ගෙවා තිබුණි. මීට අදාළ ටෙන්ඩර් අයදුම්පත තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමු කිරීමකින් තොරව, ප්‍රධාන නාගරික ඉංජිනේරු විසින් අවම මිල ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කාර ආයතනයට ඉදිකිරීම් පැවරීමට තීරණය කර තිබුණි. එසේම, යෝජිත ඉදිකිරීම සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම ඉදිකිරීම් භූමියේ පස්

සාම්පල් පරීක්ෂා කිරීම යනාදී කාර්යයන් ඉටු නොකර සැලසුම් සකස් කර, ඉදිකිරීම් පවරා තිබුණි. මේ හේතුවෙන් ගොඩනැගිල්ලේ ධාරිතාවය ද අඩු කිරීමට සිදුව තිබුණි.

(ආ) මහා නගර සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ලේ ඉහල මහලේ ශාලාව ඉදිකිරීම සඳහා රු.6,023,224 ක් ගෙවා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 ඡේදයේ විධිවිධානවලට පරිබාහිරව තාක්ෂණ ඇගයීම් කමිටුව පත් කර තිබුණේ ටෙන්ඩර් කැඳවා විවෘත කිරීමෙන් පසු 2015 සැප්තැම්බර් 29 දිනැති අංක 8(92) දරන සභා තීරණය මඟිනි. එසේම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5(ආ) වගන්තිය අනුව, ලංසු ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කාර ආයතන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (ICTAD) ලියාපදිංචිය ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මහයියාව ආදාහනාගාරය වෙනුවෙන් වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා සභා අරමුදල් යටතේ රු.1,632,385 ක ඇස්තමේන්තුගත මුදලකට කොන්ත්‍රාත්කාර ආයතනයක් සමඟ 2016 දෙසැම්බර් 20 දින ගිවිසුම්ගතව තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5(ආ) වගන්තිය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී, ලංසු ඉදිරිපත් කර තිබූ ආයතන 2 ම වලංගු ලියාපදිංචියක් ඉදිරිපත් කර නොතිබිදී, සභාව විසින් ලංසු ඇගයීමට භාජනය කර තිබුණි.

(ii) වැසිකිළි පද්ධතිය ඉදිකිරීමට යෝජිත ස්ථානයේ පැවති ලංකා විදුලි බල මණ්ඩලයට අයත් විදුලි කණුවක් ඉවත් කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත්කරුවනට ඉදිකිරීම පැවරීම හේතුවෙන්, 2017 ජුනි 29 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) මහා නගර සභාවට අයත් මධ්‍යම වෙළඳ පොළ නවීකරණය කර ඉදිකිරීම සඳහා රු.1,800,000,000 ක් මුදලකට දළ ඇස්තමේන්තු සකස් කර, 2013 නොවැම්බර් 25 දිනැති මහා සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2014, 2015 හා 2016 වර්ෂයන්වල වාර්ෂික අයවැය ලේඛනවලින් රු.20,000,000 ක් හා රු.10,000,000 ක් බැගින් ප්‍රතිපාදන සලසා ගෙන ඇතත්, වෙළඳ සංකීර්ණයේ වෙළඳ ප්‍රජාවගෙන් ලද විරෝධතාවයන් හේතු කොට ගෙන නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට සැලසුම් කිරීම අතරමඟ නවතා දමා තිබුණි.

(ii) 2013 වර්ෂයේ යථෝක්ත ඉදිකිරීම ආරම්භ කිරීමට සැලසුම් කර ඇතත්, 2016 මැයි 30 දින මහා සභාව ශක්‍යතා වාර්තාවක් පිළියෙළ කළ යුතු බව තීරණය කර තිබුණි.

(iii) සමාජ විද්‍යාත්මක සමීක්ෂණයක් කිරීමට 2016 ජූලි 20 දින තීරණය කර පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පවරා ඇතත්, එකී සමීක්ෂණ වාර්තාව 2017 පෙබරවාරි 28 දින වන විටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මහයියාව ආයුර්වේද සායනය හා අළෙවි සැල ඉදිකිරීම සඳහා රු.4,032,800 ක වැඩ වටිනාකමකට 2017 පෙබරවාරි 27 දින ගිවිසුම්ගතව ඉදිකිරීම් පවරා තිබුණි. 2017 ජුනි 29 දින වන විට ඉදිකරමින් පවතින ගොඩනැගිල්ලේ බිත්ති බැඳීම සඳහා කුහර සහිත සිමෙන්ති ගල් භාවිතා කරමින් පැවති අතර, අධීක්ෂණ නිලධාරීන් විසින් තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉදිකිරීමට යොදා ගෙන තිබූ සිමෙන්ති ගල්, වැලි හා සිමෙන්ති මිශ්‍රණයේ ප්‍රමිතිය දුර්වල මට්ටමක පැවති අතර, ජනෙල් රාමුව පිහිටන ස්ථානයේ බ්ලොක් ගල් මත "සිල් බීම්" යොදා නොතිබුණි.

(ඊ) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරණායක මාවතේ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා මහා නගර සහා අරමුදල් යටතේ රු.76,088,905 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් 2017 ජුනි 29 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වෙළඳ සංකීර්ණයෙහි බිම් මහලෙහි පිටුපස කොටසෙහි ඇලට මායිම්ව ඉදිකර ඇති බැම්මේ අත් වැලෙහි කම්බි පිටතට නිරාවරණය වී පැවති අතර, එම බැම්මෙහි වැඩ කටයුතු ක්‍රමානුකූලව අවසන් කර නොතිබුණි.

(ii) බිම් මහලේ ගොඩනැගිල්ලේ පිටුපස ආරක්ෂිත බැම්ම අතර මිදුලේ රැස් වන ජලය බැස යාමට විධිමත් ක්‍රමයක් සකස් කර නොතිබීමෙන්, වැසි දිනවල දී රැස් වන ජලය ගොඩනැගිල්ල අභ්‍යන්තරයට ගලා ගෙන ඒමෙන් කඩ කාමර ද ජලයෙන් පිරී පවතින බවක් නිරීක්ෂණය වේ.

(iii) රු.76,088,905 ක් වැය කර ඉදි කර තිබූ මහල් 3 කින් සමන්විත ගොඩනැගිල්ලේ වහල සඳහා පැරණි වහලයකින් ගලවන ලද අමානෝ සෙවිලි තහඩු සවි කර තිබූ අතර, එම සෙවිලි තහඩුවල බොහෝ ස්ථානවල පැවති සිදුරුවලින් වැසි දිනවල දී ගොඩනැගිල්ල තුළට ජලය කාන්දු වී තිබුණි.

(උ) රජපිහිල්ල මාවත, ගිණිහිරියේ නිවාස දෙකක් අසළ කාණුවක් සහ පඩි පෙළක් ඉදිකිරීම සඳහා සහා අරමුදල් යටතේ 2016 නොවැම්බර් 06 දින රු.257,921 ක් ගෙවා තිබුණි. පඩි පෙළ කොන්ක්‍රීට් කිරීම සඳහා 1:21/2:5 (මි.මි.25) ප්‍රමාණයේ අගල් 4 ක් ඝනකමින් කොන්ක්‍රීට් යෙදිය

යුතු වුවත්, ඉදිකර තිබූ කොන්ක්‍රීට් පඩි පෙළේ ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දී පරීක්ෂාවට ලක් වූ ස්ථානවල ඝනකම 2" ක් බව නිරීක්ෂණය විය.

(ඍ) රජවත්ත සිරිමාවෝ බණ්ඩාරණායක මාවතේ රථ ගාල සහිත කාර්යාල සංකීර්ණය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවා රු.62,070,559 ක මුදලකට 2014 අගෝස්තු 15 දින ගිවිසුම්ගතව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ඉදිකිරීම් පවරා තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) මෙම ඉදිකිරීම සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබූ අතර, පස් සාම්පල් පරීක්ෂා කිරීමක් ද සිදු කර නොතිබුණි.

(ii) මහා නගර සභාවේ විශේෂ ඉදි කිරීම් ව්‍යාපෘති ඒකකය මගින් සෘජු ශ්‍රමය උපයෝගී කර ගෙන මාස 7 කට අධික කාලයක් ගත කර 2014 මැයි 12 දින වන විට පොළොව කපා අත්තිවාරම් යොදා පොළොව මට්ටම දක්වා කුළුණු ඉදි කර අදාළ කාර්යය අත හැර දමා තිබුණි.

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1304/18 හා 2003 සැප්තැම්බර් 05 අති විශේෂ ගැසට් පත්‍රයෙන් වලංගු සහ බලාත්මක කරන ලද අංක 1249 හා 2002 අගෝස්තු 09 දින දරන ගැසට් පත්‍රයේ iv(අ) කොටසේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙහි iii වන කොටස 4(ආ)(i) වගන්තියට අනුව මහනුවර මහා නගර සභාවට කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කළ හැක්කේ රු.500,000 ක් හෝ ඊට අඩු ඇස්තමේන්තු වටිනාකම් සඳහා පමණක් වුවත්, එකී විධි විධානයට පරිබාහිරව කටයුතු කරමින් ඉහත ඉදිකිරීමට අදාළ රු.70,080,349 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුව සඳහා ටෙන්ඩර කැඳවීමේ දී ICTAD C 4 හෝ ඊට වැඩි හෝ මහනුවර මහා නගර සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන බවට ප්‍රසිද්ධ කර මිල ගණන් කැඳවා තිබුණි.

(iv) අවම මිලට වඩා වැඩි පුර මුදලකට අයදුම් කළ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුගේ දැනුම් දීමකට අනුව, සාධාරණ හේතුවකින් තොරව රු.61,760,211 ක අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කාර ආයතනයට ටෙන්ඩරය පිරිනැමීම ටෙන්ඩර් මණ්ඩලය ප්‍රතික්ෂේප කර තිබුණි.

(v) පසුව අවම මිලට වඩා වැඩි මුදලකට ටෙන්ඩරය ඉදිරිපත් කර තිබූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තෝරා ගෙන රු.62,070,559 ක මුදලකට 2015 මැයි 15 දිනට ප්‍රථම කර්මාන්තයේ වැඩ අවසන් කර භාර දීමේ එකගතාවයට යටත්ව 2014 අගොස්තු 15 දින

ගිවිසුම්ගතව ඉදි කිරිම් පවරා ඇතත්, 2017 ජුලි 25 දින වන විටත් අදාළ ඉදිකිරිම් අවසන් කර නොතිබුණි.

**3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

---------------------------------

පහත නිරික්ෂණයන් කෙරේ.

(අ) මහ නගර සභා බල ප්‍රදේශය තුල දිනකට කසල ටොන් 175ක් පමණ ජනනය වන අතර, දිරන කසල ගොහාගොඩ තේක්කවත්ත කසල අංගනය වෙත බැහැරකර තිබුණි. දිරන කසල භාවිතාකර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භකර ඇතත්, 2017 අගෝස්තු 01 දින වන විට නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් පොහොර කි.ග්‍රෑ. 2000 ක් පමණ අලෙවි කිරීමට සුදුසු පරිදි සකස්කර නොතිබුණි.

(ආ) ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබී තිබූ ප්ලාස්ටික් කැබලි කිරීමේ යන්ත්‍රය මඟින් ප්ලාස්ටික් කැබලිකර අලෙවි කිරීමට ඒකකයක් ස්ථාපිත කර 2017 ජූනි 07 දින වනවිට ඉන් රු.1,975,170 ක ආදායමක් උපයා ගෙන තිබුණි. එසේ වුවත් ප්ලාස්ටික් අපද්‍රව්‍ය ලැබීම්, දෛනික නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවි කිරීම්වලට අදාල විධිමත් ලේඛනගත කිරීමේ ක්‍රමයක් අනුගමනයකර නොතිබුණි.

(ඇ) මධ්‍යම පරිසර අධිකාරිය මඟින් 2014 සැප්තැම්බර් 23 දින පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය සඳහා යන්ත්‍රයක් ලබාදී තිබුණත්, 2017 අගෝස්තු 01 දින වන විටත් එම යන්ත්‍රය භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.8 අනවසර ඉදිකිරීම්.**

--------------------

මහනුවර නගරයේ ඉදිකරමින් පැවති වාණිජ ගොඩනැගිලි 4 ක් සම්බන්ධව කරන ලද විගණනයේ දි පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 11(ඒ) කොටසේ 8(ජේ) වගන්තියේ විධිවිධානවලට අනුව, මහල් දෙකකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අනුමැතිය ලබා ගෙන ඇතත්, පරීක්ෂණයට භාජනය වූ වාණිජ ගොඩනැගිලි 4 ක් අනුමැතියකින් තොරව මහල් 4 ක් බැගින් ඉදිකර තිබුණි.

(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8(ජේ) වගන්තියේ විධිවිධානවල සඳහන් වීථි රේඛා සීමාන්තයේ සිට සියලු නව ඉදිකිරීම් කළ යුතු වුවත්, එම විධිවිධානවලට පරිබාහිරව ප්‍රධාන හා අතුරු මාර්ගවලට මායිම ඉදිකර තිබුණි.

(ඇ) ලෝක උරුම ගොඩනැගිලි සංරක්ෂණ හා තාක්ෂණ අනු කමිටු වාර්තාවේ කොන්දේසිවලට පරිබාහිරව අදාළ ගොඩනැගිල්ලේ සංරක්ෂිත කළ යුතු සියලු කොටස් කඩා ඉවත් කර ගොඩනැගිලි 3 ක් ඉදිකර තිබුණි.

(ඈ) ලෝක උරුම ගොඩනැගිල්ලේ සංරක්ෂිත කළ යුතු කොටස් කඩා ඉවත් කර ඊට යොදා තිබූ ලෝක උරුම මුද්‍රාව සහිත පුවරුව පමණක් නව ගොඩනැගිලිවල බිත්තියකට සවි කර, ලෝක උරුම නිර්නායකයන්ගෙන් බැහැරව ඉදි කරන ලද නවීන ගොඩනැගිල්ල ලෝක උරුම ගොඩනැගිල්ලක් ලෙස හුවා දැක්වීමට කටයුතු කර තිබුණි.

(ඉ) එක් වාණිජ ගොඩනැගිල්ලක රථ වාහන නවතා තැබීමේ ඉඩකඩ නොසැලසීමේ ගාස්තුවලින් එකී ගොඩනැගිල්ල නිදහස් කිරීම හේතුවෙන්, නගර සභා අරමුදලට රු.1,680,000 ක පාඩුවක් සිදු කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.
---------------------------------------

### 4.1 අයවැය පාලනය.
------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් අතර වියදම් විෂයයන් 5 ක සියයට 10 සිට සියයට සියය ඉක්මවා විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මහා නගර සභා ආඥා පනතේ 212(ආ), 2014 මාර්තු 20 දිනැති අංක 2014/02 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය හා 2015 අප්‍රේල් 30 දිනැති අංක CBK/අයවැය 2016 දරන ප්‍රධාන ගණකාධිකාරීගේ ලිපියේ උපදෙස් අනුගමනය කිරීමකින් තොරව, පෙර වර්ෂයේ අය වැයට ප්‍රතිශතයන් එකතු කිරීමෙන් හා ප්‍රාග්ධන වැඩසටහන් 6 ක ව්‍යාපෘති 21 ක වැය විෂයයන් 68 ක් සඳහා රු.640,708,000 ක් ඇස්තමේන්තු සකස් කර, වාර්ෂික අය වැය ලේඛන පිළියෙළ කර තිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.
------------------------------

ප්‍රාග්ධන වැය සඳහා රු.640,708,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබියදී, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1(අ), 4.2.1(අ), 4.2.2 හා 4.2.3 වගන්තිවල දැක්වෙන අවශ්‍යතා මඟ හැර අවිධිමත්ව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර තිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය.**

**-------------------------**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134(1) ප්‍රකාරව මහ නගර සභාවේ සියලු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.**

**5. පද්ධති හා පාලනය.**

**-----------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.**

**(අ) කොන්ත්‍රාත් පරිපාලනය**

**(ආ) ආදායම් පරිපාලනය**

**(ඇ) වත්කම් කළමනාකරණය**

**(ඈ) මූල්‍ය පාලනය**

**(ඉ) ණයගැතියන් හා ණයහිමියෝ**